# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1436/8 – 2006 මාර්තු 13 වැනි සඳුදා – 2006.03.13

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

### ශ්‍රී ලංකා සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවය පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහය

1980 ඔක්තෝබර් මස 31 දිනැති අංක 113 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ 1978 ඔක්තෝබර් 01 දින දරන ශ්‍රී ලංකා සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවය පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයට ඇතුළත් කරන ලද 2005 පෙබරවාරි 14 දිනැති හා අංක 1380/3 දරන සංශෝධනයේ අංක 8(ඉ), 9 i (ඇ) හා 10 වැනි ඡේදයන් ඉවත්කර, ඒ වෙනුවට පහත සඳහන් ඡේදයන් හා උප ඡේදයන් අමාත්‍ය මණ්ඩලයේ නියෝගය පරිදි ඇතුළත් කරනු ලැබේ.

එස්. ජේ. පතිරණ,<br>
ලේකම්,<br>
වතු යටිතල පහසුකම් හා පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය.

2006 මාර්තු මස 10 වැනි දින,\<br>
වතු යටිතල පහසුකම් හා පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය,<br>
අංක 45, ශාන්ත මයිකල් පාර,<br>
කොළඹ 03.

(8) (ඉ) පශු වෛද්‍ය උපාධිධාරීන් අයදුම් පත් භාරගන්නා අවසන් දිනට පෙර ශ්‍රී ලංකා පශු වෛද්‍ය සභාවේ ලියාපදිංචි වී තිබිය යුතුය.

(9) (i) (ඇ) අදාළ තනතුරු වෙනුවෙන් අයදුම්කරුවන් පොදු ප්‍රශ්න පත්‍රයකට හා විෂයානුබද්ධ ප්‍රශ්න පත්‍රයකට පෙනී සිටිය යුතු අතර, ලබාගන්නා ලකුණු සංඛ්‍යාවේ එකතුවෙහි අනුපිළිවෙල හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව පදනම් කර ගනිමින් සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලැබේ. ඒ අනුව අදාළ බඳවා ගැනීම් සිදුකරනු ඇත. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු දීමක් සිදු නොකෙරේ.

(10) II පන්තියේ II වැනි ශ්‍රේණිය සඳහා සීමිත බඳවා ගැනීම් :-

(i) *සීමිත බඳවා ගැනීමේ ක්‍රමය.—*

II/II පංතියේ සත්වපාලන නිලධාරි තනතුරේ පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවෙන් 50% ක් සීමිත බඳවා ගැනීම්වලින් පුරවනු ලැබේ.

*(අ)* එම තනතුර වෙනුවෙන් අයදුම්කරුවන් පොදු ප්‍රශ්න පත්‍රයකින් හා විෂයානුබද්ධ ප්‍රශ්න පත්‍රයකින් සමන්විත පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය.

*(ආ)* පොදු ප්‍රශ්න පත්‍රයට හා විෂයානුබද්ධ ප්‍රශ්න පත්‍රයට ලබාගන්නා ලද ලකුණු සංඛ්‍යාවේ අනුපිළිවෙල හා වෙන්කර ඇති පුරප්පාඩු සංඛ්‍යාව පදනම් කර ගනිමින් සම්මුඛ පරීක්ෂණයකට කැඳවා අදාළ බඳවා ගැනීම් සිදුකරනු ඇත. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු දීමක් සිදු නොකෙරේ.

(ii) *සීමිත බඳවා ගැනීම සඳහා සුදුසුකම්.—*

සත්ව පාලනය/කෘෂිකර්මය පිළිබඳ දෑවුරුදු ඩිප්ලෝමාවක් සහිත සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ දැනට සේවයේ නියුතු පශ සම්පත් සංවර්ධන නිලධාරියකු/පර්යේෂණ සහකාරවරයකු හෝ පළාත් සභා සේවයේ නියුතු සත්ව සංවර්ධන උපදේශකවරයකු වීම සහ ශ්‍රී ලංකා පශු සම්පත් සංවර්ධන නිලධාරි සේවයේ හෝ පළාත් සභා සේවයේ නියුතු සත්ව සංවර්ධන උපදේශකවරයකු වශයෙන් හෝ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ විශේෂ පංතියේ හෝ I වැනි පංතියේ වසර 04 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම

*හෝ*

පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් සත්ව පාලන විද්‍යා හෝ කෘෂිකර්මය පිළිබඳ සිව් අවුරුදු උපාධියක් සහිත වසර 05 ක සේවා කාලයක් ඇති සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ පශු සම්පත් සංවර්ධන නිලධාරි/පර්යේෂණ සහකාර/පළාත් සභා සේවයේ නියුතු සත්ව සංවර්ධන උපදේශකවරයෙකු වීම.

03-639

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.